# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2126/47 - 2019 ජුනි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2019.06.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1) (අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක : 2103/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 මැයි මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 ජුනි මස 05 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

(1) එම නිවේදනයෙහි අංක (16) ''කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි අංක (16) ශීර්ෂය, ''කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය'' වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි I අයිතමය -

1. කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයයට සහ 11 වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම'' වශයෙන් ;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) එහි I වැනි තීරුවෙහි 30 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි අයිතම 29 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි 25 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අයිතම 24 සිට නැවත අංකගත කිරීමෙන් ;

(2) එම නිවේදනයෙහි අංක (18) ''රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි අංක (18) ශීර්ෂය, ''රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය'' වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි I අයිතමය -

1. රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම'' වශයෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි 23 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

24. ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූලාධාර සම්පාදනය

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 24 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි 10 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

11. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

06 - 631

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.